# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1973/21 - 2016 ජුනි මස 28 වැනි අඟහරුවාදා - 2016.06.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත**

14 වැනි වගන්තිය යටතේ නියෝගය

වැඩ බලන සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය සුජීව සේනසිංහ වන මම, මුදල් අමාත්‍යවරයාගේ ද එකඟත්වය ඇතිව 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මෙම නියෝගය මගින් මෙම පනතේ 14(1) වැනි වගන්තිය යටතේ පනවන ලද 2015.11.20 දිනැති අංක 1941/33 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද නියමයෙහි උපලේඛනයෙහි 1 වන තීරුවෙහි පහත සඳහන් සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ නිශ්චිතව සඳහන් වූ සෑම ආනයන භාණ්ඩයක් සඳහාම ඊට අනුරූපව මෙහි උපලේඛනයෙහි II හා III වන තීරුවල නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති සෑම ආනයන භාණ්ඩයක් මතම ඊට අනුරූපව මෙහි උපලේඛනයෙහි IV වැනි තීරුවෙහි දක්වා ඇති අනුප්‍රමාණයන් පරිදි 2016.06.29 වැනි දින සිට සෙස් බද්දක් නියම කොට අයකර ගත යුතු බව, ප්‍රකාශයට පත් කරමි.

සුජීව සේනසිංහ,
*වැඩ බලන සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය.*

2016 ජුනි මස 28 වැනි දින,
කොළඹ 01,
සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| *සං.ව. ශීර්ෂය* I | *සංයෝජිත වර්ගීකරණ සංකේතය* II | | *විස්තර* III | *සෙස් බදු ප්‍රමාණය* IV |
|---|---|---|---|---|
| **22.02** | | | **සීනි හෝ අනෙකුත් පැණිරස කාරක ද්‍රව්‍යයන් එකතු කරනු ලැබුවා වූ හෝ රස කළා වූ, ඛනිජ ජලය හා වායුව කවන ලද (එරේටඩ්) ජලය ඇතුළු ජල වර්ග හා ශීර්ෂ 20.09 හි සඳහන් පළතුරු හෝ එළවළු යුෂ අඩංගු නොවූ අනෙකුත් අමද්‍යපාන වර්ග.** | |
| | | | | |
| | 2202.10 | - | සීනි හෝ වෙනත් පැණිරස කාරක ද්‍රව්‍යයන් එකතු කරනු ලැබුවා වූ හෝ රස කළාවූ, ඛනිජ ජලය හා වායුව කවනු ලැබුවා වූ (එරේටඩ්) ජලය ඇතුළු ජල වර්ග | 5% |

07 - 636


1A - PG 2993 — 507 (2016/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*